නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.9 - සැපයුම් මිල නම්‍යතාව ගණනය කරමින් එහි භාවිතයේ වැදගත්කම විග්‍රහ කරයි.

- සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වීම කෙරෙහි සැපයුම් ප්‍රමාණය දක්වන සංවේදීතාව සැපයුම් මිල නම්‍යතාවයි.

$$\text{සැපයුම් මිල නම්‍යතාව} = \frac{\text{සැපයුම් ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස}}{\text{මිලෙහි ප්‍රතිශතාත්මක වෙනස}}$$

සැපයුම් නම්‍යතා සංගුණකය සඳහා ලැබෙන අගය ශුන්‍යයේ (0) සිට අපරිමිත (α) දක්වා වෙනස් වේ.

1.)කිසියම් භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

මිල (රු.)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
5	100
10	500

මිල රු.5 සිට 10 දක්වා වැඩි වන විට සැපයුම් නම්‍යතාව ගණනය කරන්න.

2.) කිසියම් භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

මිල (රු.)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
10	100
20	200

ඉහත තොරතුරු හා සම්බන්ධ වාප සැපයුම් නම්යතාව ගණනය කරන්න.

3.)සැපයුම් නම්‍යතා සංගුණකයෙහි අගය පදනම් කර ගනිමින් දැක්විය හැකි සැපයුම් මිල නම්‍යතා ප්‍රභේද පහ කෙටියෙන් පැහැදිලි කරන්න.